සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 09 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 09 - 2023

## පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02 යි

නම / විභාග අංකයඃ

### I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- මෙම පත්‍රය සඳහා 2 × 20 = ලකුණු 40ක් හිමි වේ.

- ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01. මෙරටට සීමිත ඡන්ද බලය හඳුන්වා දුන්නේ ................................................................ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
(සෝල්බරි / ඩොනමෝර් / කෘෘ මැකලම්)

02. එක් රටක් තවත් රටක් සමඟ හෝ රටවල් කිහිපයක් සමඟ හෝ සම්බන්ධ වී කටයුතු කිරීමේ දී බලපවත්වන නීතිය ....................................................... වේ.
(දේශීය නීතිය / ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය / අන්තර් ජාතික නීතිය)

03. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ....................................... අධිකරණයේ ප්‍රධානතම කාර්යයක් වේ.
(නීති ක්‍රියාත්මක කිරීම / නීති සම්පාදනය / යුක්තිය පසිඳලීම)

04. ඒක පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටක් ලෙස ..................................................... හඳුනාගත හැකිය.
(ඇමරිකාව / බ්‍රිතාන්‍ය / කියුබාව)

05. සීමිත සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම.................................................... ලෙස හැඳින්වේ.
(ඵලදායීතාවය / කාර්යක්ෂමතාවය / සංවර්ධනය)

- ප්‍රශ්න අංක 06 - 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති වගන්ති නිවැරදි නම් ( ✓ ) ලකුණ ද, වැරදි නම් (× ) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

06. ගැටුම්කාරී අවස්ථාවලට යහපත් ලෙස ප්‍රතිචාර දැක්වීම නිසා නව අදහස්, නව නිර්මාණ, නව සම්බන්ධතා ඇතිවිය හැකිය. (............)

07. උගත් ලාංකිකයින් වෙනුවෙන් සීමිත ඡන්ද බලය මගින් පළමුව ව්‍යවස්ථාදායක සභාවට තේරී පත් වූ මන්ත්‍රීවරයා පොන්නම්බලම් අරුණාචලන් විය. (............)

08. ගැටුම් නිරාකරණය සඳහා යොදාගත හැකි සරලම ක්‍රමය උපදේශනයයි. (............)

09. ආරම්භයේ දී සැලසුම් කළ අරමුණු ඒ අයුරින්ම ළඟා කර ගැනීම ඵලදායිතාව ලෙස හැඳින්වේ. (............)

10. මානව සමාජය යහපත්ව පවත්වාගෙන යාම සඳහා ප්‍රගුණ කළ යුතු ගුණාංග යහජීවන ගුණාංග ලෙස හැඳින්වේ. (............)

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න හොඳින් කියවා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. ගැටුම් ඇතිවීමට බලපාන හේතුවකි,
    i. විවිධ මතවාද ii. ආක්‍රමණශීලී නොවීම
    iii. විකල්ප සොයා බැලීම iv. පරාර්ථකාමී බව

12. රැකියාව තුළ සාර්ථකත්වයට පත්වීමට නම් ඔබ තුළ වර්ධනය කරගත යුතු ගුණාංගයක් නොවන්නේ කුමක් ද?
    i. අධිෂ්ඨානය හා කැපවීම ii. ශ්‍රමාභිමානය
    iii. සේවායෝජක අපේක්ෂා අනුව වැඩ නොකිරීම iv. නිවැරදි මූල්‍ය කළමනාකරණය

13. "ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සියලු දෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයකි" ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ මෙම නිර්වචනය ඉදිරිපත් කළේ,
    i. ඒබ්‍රහම් ලින්කන් ii. සීලර් iii. එඩ්මන්ඩ් බර්ක් iv. ජෝන් එෆ් කෙනඩි

14. උසස් පෙළ කලා විෂය ධාරාව හදාරන ශිෂ්‍යයකුට / ශිෂ්‍යාවකට වැඩ ලෝකය තුළ පවතින රැකියා අවස්ථාවකි,
    i. වෛද්‍ය ii. ගුරු iii. රසායනාගාර ශිල්පී iv. ගණකාධිකාරී

15. සහජීවන ගුණාංග ජීවිතයට අදාළ කර ගැනීමෙන් ඇතිවන ප්‍රතිලාභයක් නොවේ,
    i. පුද්ගල සංවර්ධනය ii. ගැටුම් වර්ධනය
    iii. සාමය ස්ථාපිත වීම iv. සමාජ සංවර්ධනය වේගවත් වීම

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන පරිදි පිළිතුරු සපයන්න.**


A

16. A පින්තූරයේ දැක්වෙන අවස්ථාව නම් කරන්න.

    ..........................................................................................................

17. එවැනි අවස්ථාවකට ඉදිරිපත් වීමේදී ඔබ සැළකිලිමත් විය යුතු කරුණු 02ක් ලියන්න.

    i. ..........................................................................................

    ii. ..........................................................................................

18. රැකියා ඇබෑර්තුවක් සඳහා ප්‍රතිචාර දැක්විය හැකි ක්‍රම 02ක් ලියන්න.

    i. ..........................................................................................................................

    ii. ..........................................................................................................................


B

19. B පින්තූරයෙන් දැක්වෙන්නේ වෘත්තීය පුහුණුව ලබාදෙන අවස්ථාවකි. ශ්‍රී ලංකාවේ වෘත්තීය පුහුණුව ලබාදෙන ආයතන 02ක් සඳහන් කරන්න.

    i. ..........................................................................................

    ii. ..........................................................................................

20. වෘත්තීය පුහුණු පාඨමාලාවකට සම්බන්ධ වීම මගින් ඔබට ලබාගත හැකි ප්‍රයෝජන 02ක් සඳහන් කරන්න.

    i. ..........................................................................................

    ii. ..........................................................................................


(20 × 2 = ලකුණු 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වන අතර එම ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

01. i. ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක ලක්ෂණ 02ක් සඳහන් කරන්න.
ii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද බලය අහිමි වීමට බලපාන හේතු 02ක් නම් කරන්න.
iii. වර්තමානයේ පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලු 02ක් ලියන්න.
iv. අධිකරණය සම්බන්ධ පුද්ගල වගකීම් හා යුතුකම් 02ක් නම් කරන්න.
v. පාසල් සමුපකාර සමිතියෙන් පාසල් දරුවන්ට ලබාගත හැකි සේවා 02ක් සඳහන් කරන්න.
vi. ගැටුම් සුබවාදී ව නිරාකරණය කර නොගැනීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිවිපාක 02ක් නම් කරන්න.
vii. රැකියාවක නියුතු පුද්ගලයෙකුට කාල කළමනාකරණයේ ඇති වාසි 02ක් ලියන්න.
viii. මුදල් පරිහරණයේ දී බැංකු ගිණුමක් පවත්වාගෙන යාම හරහා සැලසෙන වාසි 02ක් සඳහන් කරන්න.
(2 × 8 = ලකුණු 16)

02. i. රජයේ සියලුම නීතිමය කටයුතු සම්බන්ධ වගකීම පැවරී ඇති ආයතනය හා එහි ප්‍රධාන තනතුර ලියා දක්වන්න. (ල. 02)
ii. පහත දැක්වෙන්නේ දේශීය නීතිය ප්‍රභේද කර ඇති ආකාරයයි. එහි A, B, C වලින් දැක්වෙන නීති ප්‍රභේද නම් කරන්න. (ල. 03)




iii. සමාජ සුරක්ෂිතතාව සඳහා පාසලෙන් ඉටුවන කාර්යයන් 03ක් සඳහන් කරන්න. (ල. 03)
iv. සමාජ සුරක්ෂිතතාව සඳහා ශ්‍රී ලංකා පොලීසියෙන් ඉටුවන කාර්යයන් 03ක් සඳහන් කරන්න. (ල. 03)

03. i. ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ස්වරූප 02 සඳහන් කරන්න. (ල. 02)
ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ 03ක් ලියන්න. (ල. 03)
iii. මැතිවරණ සම්බන්ධ පුරවැසි අයිතිවාසිකම් හා යුතුකම් කිහිපයක් පහත දැක්වේ. ඒවා නිවැරදිව පහත වගුවේ ලියා දක්වන්න. (ල. 06)
A. උගත් බුද්ධිමත් හා ආදර්ශවත් නායකයෙකුට තම ඡන්දය ප්‍රකාශ කිරීම
B. දේශපාලන ප්‍රචාරණ කටයුතුවල යෙදීම
C. සාධාරණ හේතුමත ආණ්ඩුව විවේචනය කිරීම
D. මැතිවරණ නීතිරීතිවලට අවනත වීම
E. දේශපාලන පක්ෂ පිහිටුවා ගැනීම
F. ජය පරාජය සමව සලකා භුක්ති විඳීම

| මැතිවරණ සම්බන්ධ පුරවැසි අයිතිවාසිකම් | මැතිවරණ සම්බන්ධ පුරවැසි යුතුකම් |
|---|---|
| | |

04. i. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග 03 නම් කරන්න. (ල. 03)

ii. ප්‍රාදේශීය අවශ්‍යතා හා සම්පත් හඳුනාගෙන ඊට ගැළපෙන පරිදි සැලසුම් සකස් කිරීම පළාත් පාලන ආයතනවල ප්‍රධාන කාර්යයකි. පහත සඳහන් ප්‍රාදේශීය අවශ්‍යතා ඉටුකිරීමේදී පළාත් පාලන ආයතන අනුගමනය කළ යුතු පියවර 2 බැගින් ලියන්න. (ල. 04)

ජල හිඟයක් පවතින ප්‍රදේශ
→ 1. ..............................................................................................
→ 2. ..............................................................................................

නාගරික ප්‍රදේශයක කසළ බැහැර කිරීම
→ 1. ..............................................................................................
→ 2. ..............................................................................................

iii. පළාත් පාලන ආයතනවල සේවා සම්බන්ධයෙන් මහජනතාව විසින් ඉටුකළ යුතු යුතුකම් 04ක් සඳහන් කරන්න. (ල. 05)

05. i. ගැටුම් ඇතිවන පාර්ශ්ව 02ක් සඳහන් කරන්න. (ල. 02)

ii. ලෝකයේ දක්නට ලැබෙන ගැටුම් එහි ස්වභාවය අනුව ආකාර කිහිපයකට වර්ග කළ හැකියි. එම වර්ග 03 මොනවාදැයි නම් කරන්න. (ල. 03)

iii. ගැටුම් නිරාකරණය සඳහා භාවිත කළ හැකි ක්‍රමවේද 03ක් සඳහන් කරන්න. (ල. 03)

iv. ගැටුම් සුබවාදීව නිරාකරණය කිරීමේ වාසි 03ක් ලියන්න. (ල. 03)

06. i. පෞද්ගලික ගොනුවක ඇතුළත් විය යුතු දෑ ඇසුරින් පහත සටහන සම්පූර්ණ කරන්න. (ල. 04)

| | |
|---|---|
| 1. පෞද්ගලික තොරතුරු<br>a. ........................................<br>b. ........................................ | 2. පෞද්ගලික ගුණාංග<br>c. ........................................<br>d. ........................................ |
| 3. පාසලේ දී ලබාගත් අත්දැකීම්<br>e. ........................................<br>f. ........................................ | 4. පාසලෙන් පිටත දී ලබාගත් අත්දැකීම්<br>g. ........................................<br>h. ........................................ |

ii. වැඩ ලෝකයේ පවතින රැකියා ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක්වේ. එම ක්ෂේත්‍රවලට අදාළ රැකියා 01 බැගින් ලියන්න. (ල. 03)

a. සේවා යෝජක රැකියා : ........................................................................
b. ස්වයං රැකියා : ........................................................................
c. ස්වේච්ඡා රැකියා : ........................................................................

iii. ණයපත් භාවිතයේ වාසි 02ක් හා අවාසි 02ක් සඳහන් කරන්න. (ල. 04)

.................................................................... ....................................................................
.................................................................... ....................................................................

07. i. නිවස තුළ භාවිත කෙරෙන තාක්ෂණික උපකරණ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න.

| තාක්ෂණික උපකරණය | ලබාගත හැකි ප්‍රයෝජන |
|---|---|
| A. ........................................................ (ල. 01) | i. ........................................................<br>ii. ........................................................ (ල. 01) |
| B. ........................................................ (ල. 01) | i. ........................................................<br>ii. ........................................................ (ල. 01) |

ii. අතීතයේ භාවිත කළ උපකරණ හා තාක්ෂණයේ දියුණුවත් සමඟ වර්තමානයේ භාවිත කරන උපකරණ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරන්න. (ල. 04)

| ක්ෂේත්‍රය | අතීතයේ භාවිත කළ උපකරණ / උපක්‍රම | වර්තමානයේ භාවිත කරන උපකරණ |
|---|---|---|
| අධ්‍යාපන | A. ................................. | B. ................................. |
| සන්නිවේදනය | C. ................................. | D. ................................. |

iii. තාක්ෂණික වෙනස්වීම් නිසා මිනිසාට මුහුණ පෑමට සිදුව ඇති අහිතකර ප්‍රතිඵල 03ක් සඳහන් කරන්න. (ල. 03)